

# රෝස කුමාරි

කතෘ - සිතුමිණී කොටන්දෙණිය

# රෝස කුමාරි

සිතුමිණී කොටන්දෙණිය

# පිදුම

මා විසින් මෙම පොත් පිංච ලියන ලද්දේ
මාගේ හිතේ තිබූ එක් ආශාවක් ඉශ්ඨ කර
ගැනීමටයි. එනම් මා කුඩා කල සිටම
කතන්දර පොත් කියවීමට දැඩි ලෙස
ආශා කළෙමි. එයින් ලද විවිධ අත්දැකීම්
එකතු කරගෙන මාගේ පාසලේ
පන්තිභාර ගුරුතුමියගේ මග පෙන්වීම
මත මෙම පොත ලිවීමට මා හට
අවස්ථාව හිමි විය.
මෙම පොත් පිංචේ අඩංගු වන්නේ කුඩා
රජ කුමරියක් දිනක් සුවයේ නිදාගෙන
සිටියදී දුටු බියකරු සිහිනයක් පිළිබඳවයි.
එම සිහිනය මා විසින් මෙසේ රචනා කර
ඔබ සැමට ඉතා සතුටින් පුදන්නෙමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරිම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජිවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිණිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20



එකෝමත් එක කාලෙක රජතුමෙකුයි බිසවෙකුයි සිටියා

මේ දෙන්නා හරිම සතුටින් කාලය ගත කළා.

මේ රජ මාලිගාවේ ලස්සන මල් උයනක් තිබුණා

රජතුමයි බිසවයි හැමදාම උදේට මල් උයනට යනවා.



එක දවසක් බිසව මල් උයනට ගියා.

බිසව මල් උයනේ ලස්සන රෝස මලක් දුටුවා.

බිසව ඒ මල දැකලා ලස්සන රෝස පැහැති ඇති දරුවෙකු සාදා ගන්න සිතුවා.

මෙක රජතුමාට පැවසුවා.

රජතුමයි බිසවයි මේ ගැන කතා කරද්දි ඉබේම කාලය ගත වුණා.




ටික දවසකින් බිසවගේ බලාපොරොත්තුව ඉටු වුණා.

බිසවටයි රජතුමාටයි හරිම සතුටුයි.

බිසවට ගැහැණු දරුවෙකු ලැබුණා.

රජතුමාටයි බිසවටයි ඉවසිල්ලක් නැහැ දූ කුමරිය ලොකු වෙනකල්.

නිල්වන් ඇස් දෙකක්ද රෝස පැහැය ඇති කම්මුල්ද පිහිටා ඇත.



එක දවසක් රජතුමා කල්පනා කළා කුමරියට නමක් තැබීමට.

මේක බිසවට පැවසුවා.

බිසව ඒකට කැමති වුණා.

බිසවයි රජතුමයි කුමරිය සමග කාලය ගත කළා.

රජතුමාට හරිම සතුටුයි.




රජතුමයි බිසවයි පසු දින අවදි වුණා.

චූටි කුමරියට නම් තබන දවස උදා වුණා.

දූ කුමරිය රෝස මලක් මෙන් ලස්සනයි.

එම නිසා රජතුමයි බිසවයි රෝස කුමරිය කියා කුමරියට නම් තැබුවා.



දූ කුමරිය ටිකෙන් ටික උස් මහත් වුණා.

කුමරිය මල් උයනට යනවා.

මල්, සමනල්ලු, ගස් කොළන්, කුරුල්ලන්ට මේ වගේ අයට රෝස කුමරිය හරොම ආදරෙයි.

රෝස කුමරිය හරිම සතුටින් කාලය ගත කළා.



කුමරිය මල් උයනට ගියා. කුමරිය ලස්සන හාවෙක් දැක්කා.මේ හාවා මායාකාරියක්

හාවා කුමරියව පාලු කැලෑවකට ගෙන්වා ගත්තා.

එතකොටම හාවා මායාකාරියක් වුණා.

රෝස කුමරිය බියට පත් වුණා. හයියෙන් කෑ ගැහුණා. රෝස කුමරිය දැක තිබෙන්නෙ සිහිනයකි. රෝස කුමරිය නින්දෙන් ඇහැරුණා.

# - නිමි -

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථීක පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN 978-624-208-021-5